# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.20 පැය 0815 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /784 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ගිනි අවි සහ උණ්ඩ සමග මනුෂ්‍ය ඝාතනයකට සූදානම්ව සිටි සැකකරුවන් හය දෙනෙකු, අපරාධයට සැකපිට සැකකරුවන් දෙදෙනෙකු හා සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් සමග සම්බන්ධතා පවත්වන තවත් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථානය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථානයේ නිලධාරින් කණ්ඩායමකට ලද තොරතුරක් මත 2025.04.19 වන දින ගම්පහ පොලිස් වසමේ වතුමුල්ල ප්‍රදේශයේදී නිවසක් පරික්ෂා කර එහි සිටි සැකකරුවන් හය දෙනෙකු ටී-56 ගිනි අවි 02ක්, ටී-56 උණ්ඩ 118ක්, ටී-56 මැගසින් 03ක්, වෑන් රථයක්, කාර් රථයක් හා ත්‍රීරෝද රථයක්ද සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 24, 25 හා 26 යන වයස්වල පසුවන ගාල්ල, අනුක්කනේ, උඩුගම්පල, ගම්පහ යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් අනාවරණය කර ගත් තොරතුරු මත වෙනත් අපරාධයකට සම්බන්ධ යැයි සැකපිට තවත් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 57 යන වයස්වල පසුවන උඩුගම්පල, ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

එමෙන්ම අපරාධ කල්ලි සාමාජිකයින්ට ඉහත සැකකරුවන් දෙදෙනෙකු සම්බන්ධ කර දුන් තවත් සැකකරුවෙකු ජංගම දුරකතන 04ක් සමග කුරුණෑගල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25ක් වන හෙට්ටිපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අත්අඩංගුවට ගත් සැකකරුවන් කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇති අතර මොවුන් සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමශර්නයේදී දැනට විදේශ ගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකුගේ අනුගාමිකයින් දෙදෙනෙකුගේ

මෙහෙයවීම මත පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමට සූදානම්ව සිට ඇති බවටත්, මෙම සැකකරුවන්ගෙන් සිව් දෙනෙකු යුධ හමුදා සේවයෙන් ඉවත් වූ අයවලුන් බවටත් වැඩිදුරටත් අනාවරණය වී ඇත.

සැකකරුවන් හට රැඳවුම් නියෝග ලබා ගෙන ඉදිරි විමශර්න කොළඹ අපරාධ කොට්ඨාසය මගින් සිදු කිරීමට නියමිතය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**